

# ගිම්හාන සුළඟ හමා ගිය පසු



නිසංසලා රත්නායක

**කෞෂල්‍යා ධර්මවර්ධන** නම් වූ යුවතියට බොහෝ දෙනෙක් ආදරය කළ බව මම දනිමි  යන එන තැනකදී උත්සවයකදී හමු වන පාඨකයින් ගේ විමසිලි බස් නිසාත් විදේශයන්හි සිට අන්තර්ජාලයෙන් සන්නස කියවන නොදුටු පාඨකයන් ගේ ඊමේල් අදහස් දැක්වීම් නිසාත් මම ඒ බව පසක් කරගෙන සිටියෙමි. එනමුදු ඔවුන් ඇයට කෙතරම් පෙම් බැන්දාදැයි මා නියම ආකාරයෙන් වටහා ගත්තේ ගිම්හාන සුළඟ පසුගිය මාසයේ නිමා වූ පසුව ය.

"කෞෂල්‍යා ඒ තරම් දරුණු ඉරණමකට යොමු කරද්දී ඔබට කණගාටුවක් දැනුණේ නැද්ද?" යි ස්වීඩනයේ සිට ලැබුණ



ඊමේලයක මගෙන් අසා තිබුණි.

ගිම්හාන සුළඟේ කෞෂල්‍යා ධර්මවර්ධන ගේ චරිතයට පණ දුන් සුන්දර යුවතිය නව කතාවට විශාල ආලෝකයක් ගෙන දුන්නාය.  බොහෝ දෙනෙකුට ඇය පිළිබඳ දැන ගන්නට ද විශාල උවමනාවක් තිබුණ බව මම දනිමි.

ගිම්හාන සුළඟ ආරම්භ වූයේ පහන පුවත්පතේ ය  මේ නවකතාවේ යුවතිය ගේ චරිතය සඳහා අප අතරම වෙසෙන තරුණියක යොදා ගත යුතුය යන්න අපේ මතය විය  නම් කීපයක්ම යෝජනා විය අවසානයේ අසෝක සිල්වා/ ලක්ෂ්මි සිල්වා විසින් ගෙන එනු ලැබූ යෝජනාව අපි පිළිගත්තෙමු  නිසංසලා රත්නායක නම් වන ඇය කෞෂල්‍යා ධර්මවර්ධන වූයේ එසේය.

"මේ චරිතයට පෙනී සිටීම මට ලොකු අත්දැකීමක් වුණා.. හැම තැනකදිම හුඟක් අය මා එක්ක කතා කරලා කතාව ගැන ඇහුවා.. " නිසංසලා මා සමග පැවසුවා ය ".. යන යන තැනදි හැමෝම මගෙන් ඇහුවෙ ඒ කතාව මගේම කතාවද කියලයි..." ඇය සිනාසුණා ය.

මම වතාවක් ලංකාවේ සිට පැමිණෙන හිතවතෙකු කැඳවාගෙන ඒම සඳහා මෙල්බන් ගුවන් තොටට ගියෙමි. කිසියම් ගුවන් යානාවකින් පැමිණි ශ්‍රී ලාංකික පෙනුමැති යුවතියක් සිය ගමන් මළු සහිත ට්‍රොලියද ළඟ තබාගෙන, තමා කැඳවාගෙන යන්නට කිසිවකු පැමිණෙන තෙක් නොයිවසිල්ලෙන් බලා සිටිනු මම දුටුවෙමි. ඈ බොහෝ බියපත්ව සිටියා යයි මට සිතුණි. තවත් ශ්‍රී ලාංකික තරුණයන් කීප දෙනෙකු ඈත කෙළවරක සිට ඇය දෙස බලමින් හොරගල් ඇහිලූ සැටි ද මම බලා සිටියෙමි. පසු කලෙක ගිම්හාන සුළඟ නවකතාව මා ආර්ම්භ කලේ ඒ සිදුවීමෙන් ය.

"මේ කතාව මගේ කතාවට සමාන යි" එසේ කියූ යුවතියක ද අප පහනේ සිටි යුගයේ සෙව්වන්දිකා ට හමුවී තිබුණි.

"මට ඉතින් හැමෝටම කියන්න වුණා මේ මගේ කතාව නෙවෙයි කියලා"   නිසංසලා පියකරු ලෙස සිනාසෙයි.

ඇය කතාව ගලා ගිය මාස 19 ක කාලය තුළ අපට විශාල සහයෝගයක් දුන්නා ය. ඡායාරූප ගැනීම සඳහා වරින් වර වරුණ සාවින්ද (පහන යුගයේ දී) හා මා හමුවුණා ය.

නිසංසලා දක්ෂ නර්තන ශිල්පිණියකි. විදෙස් ගත අපේ බොහෝ තරුණියන් හරසුන් දේ පසු පස දිව යද්දී ඇය ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ශ්‍රී ලාංකික ප්‍රජා කටයුතු සිය නර්තනයෙන් රසවත් කළා ය. එමතු ද නොව සිය අධ්‍යාපන කටයුතු ද මැනැවින් නිම කළා ය.  උසස් අධ්‍යාපනය හමාර කළ නිසංසලා දැන් සේවය කරන්නේ නැෂනල් ඔස්ට්‍රේලියා බැංකුවේ ය.

ඇගේ ගමන පිළිබඳව අගේ මවත් එකම සොහොයුරාත් ආඩම්බර වන බව නිසැක ය.

"මාව මේ කතාවට තෝරගත්ත එක ගැන මම අසෝක අංකල් ඇතුළු හැමෝටම ස්තුතිවන්ත වෙනවා" නිසංසලා අවසානයට කීවා ය.

මේ සටහන නිම කරන මේ මොහොතේ සිඩ්නි සිට අපට ලියන රසිකා පෙරේරා කිවිඳියගේ ඊමේලයක් ලැබෙයි. *"The way you decided to end the serialised novel in Sannasa is pretty sad.  You could have given it a decent ending rather than the total distruction of that poor girl and her entire family."* ඇය මට කියයි. ඇයට දෙන්නට පිළිතුරත් මට සොයා ගත නොහැකි ය. ඒ, මා ද, කෞෂල්‍යා ධර්මවර්ධන නම් වූ සොඳුරු යුවතියගේ ඉරණම පිළිබඳව අවංකවම කණගාටු වන නිසා ය.



**ජගත් ජේ එදිරිසිංහ**





